තාරකා විද්‍යාව

# උතුරු තරුව



උතුරු ධ්‍රැව තාරකාවල දෘශ්‍යමාන ගමන කැමරා ඇසින් (මධ්‍යයේ ඇති පුළුල් රේඛාව උතුරු ධ්‍රැව තාරකාවේ ගමන නිරූපනය කරයි.)

රාත්‍රී අහසේ දිළෙන තාරකා අතුරින් ඉතා වැදගත් ම තාරකාව වනුයේ උතුරු තරුව නොහොත් ධ්‍රැව තාරකාව යි. චුම්භක මාලිමාව සොයා ගැනීමට පෙර රාත්‍රී කාලයේ පොළොවේ දිසා සොයාගැනීම සඳහා කාන්තාර සහ මුහුදු සංචාරකයන් විසින් මෙම තාරකාව යොදා ගැනීම ඊට හේතුව යි.

ධ්‍රැව තාරකාවට අමතර ව තවත් තාරකා 56 ක් මේ සඳහා යොදාගත් බව පෙනේ. මෙසේ වුවද එ සියලු තාරකා අතුරින් පොළොවේ උතුරු දිසාව සලකුණු කෙරෙන ධ්‍රැව තාරකාව ප්‍රධාන විය. මේ අනුව පොළොවේ ප්‍රධාන තියමු තාරකාව වශයෙන් ධ්‍රැව තාරකාව සියවස් ගණනක් ම මිනිසා විසින් භාවිත කොට ඇත.

ධ්‍රැව තාරකාව විවිධ ජාතීන් විසින් විවිධ නම්වලින් හඳුන්වනු ලැබ ඇත.

මීට සහස්‍රයකට පමණ පෙර ඇන්ග්ලෝසෙක්ෂන් ගෝත්‍රිකයන් විසින් ධ්‍රැව තාරකාව හඳුන්වනු ලැබුයේ 'නැව් තරුව' යන අරුතින්, 'Scip - steorra' වශයෙනි.

පැරණිම තාරකා විද්‍යාඥයන් වන අරාබි ජාතිකයන් උතුරු තරුව යන අරුතින් ම ඒ ' Al Kankab al Shamaliyy' නොහොත් ම මක්කම පිහිටි දිසාව දක්වන බැවින් ඒ අරුතින් 'Al Kiblah' යනුවෙන් හඳුන්වා ඇති බව පෙනේ.

ක්‍රිස්තෝදයට පෙර විසූ කොන්ෆියුසියස් තුමා ධ්‍රැව තාරකාව නිසලව තිබියදී (සාවද්‍ය) අනෙක් තාරකා ඒ වටා භ්‍රමණය වීම 'සුචරිතයෙන් ලොව පාලනය කරන්නා හුදෙක් අනෙක් තරු තමා වටා පැදකුණු කරන අතර අහසේ ස්ථිරව පවතින ධ්‍රැවතාරකාව බඳු ය.' යනුවෙන් සිය දේශනාවලදී සඳහන් කොට ඇත. නෙබ්රස්කාවල පෝනි ඉන්දියානුවරුන් ධ්‍රැව තාරකාව 'නොඇවිදින තරුව' වශයෙන් හඳුන්වා ඇත.





උර්ෂා මේජර් රාශියේ මහවලහා (17 වැනි සියවසේ හෙවිලියස් නම් තාරකා විද්‍යාඥයාගේ චිත්‍රයකි.)

## ආර්. බී. අතපත්තු

ඒ ධ්‍රැව තාරකාව නොබැස එක තැනක ම ඇතැයි යන විශ්වාසය මත ඇතිකරගත් අදහසකි. එනම් අත්වර්ත කෙරුණු නමකි. ආසියාතික රටවල, විශේෂයෙන් ඉන්දියාවේ පවත්නා විශ්වාසයක් අනුව, ධ්‍රැව තාරකාව 'සක්වළ ගල' (Cosmic Mountain) නොහොත් 'විශ්වයේ අක්ෂය' වන 'මහා මේරුව' නොහොත් 'සුනෙර' යනුවෙන් හැඳින්වේ. යොදුන් 84,000 ක් ඉහළ මේ මහාමේරු ශිඛරය මත ඉන්ද්‍ර, සූර්ය, විස්නු සහ සෙසු දෙවිවරුන් වාසය කරන බව ඔවුහු විශ්වාස කරති. ඉන්දියාවේ සහ නැගෙනහිර ආසියාතික රටවල දේවස්ථාන 'සක්වළ ගලේ' ආකෘතියෙන් ඉදිකොට ඇති බව කියති. පැරණි චීන ජාතිකයන් ද ධ්‍රැව තාරකාව හඳුන්වනු ලැබුයේ 'විශ්වයේ අක්ෂය' යනුවෙනි.

බොහෝ විට මෙම විශ්වාස එද ටොලමි ගේ භූ කේන්ද්‍රීය විශ්වය නොහොත් පොළොව විශ්වයේ මැද පිහිටියේ ය යන මතය පදනම් වී ඇති වූ ඒවා සේ පෙනෙයි.

බෞද්ධ සාහිත්‍යයේ එන ජාතක කථාවල ද කාන්තාරවල රාත්‍රී කාලයේ ගමන් කළ ගැල්සාත්තු සඳහා ගමන් මඟ සොයා ගත්තේ අහසේ තාරකා උපයෝගී කොට ගෙන බව කියැවෙයි.

පොළොව වටා ගෝලයක් සේ ඇති අහස හැඳින්වෙනුයේ ඛගෝලය යනුවෙනි. අහසේ තාරකා රාශි හඳුනාගැනීමේ මූලික පහසුව සඳහා ඛගෝලය උතුරු ධ්‍රැව තාරකා රාශි, දකුණු ධ්‍රැවතාරකා රාශි සහ සමක තාරකා රාශි යනුවෙන් ප්‍රදේශ තුනකට බෙදා දැක්වේ. ධ්‍රැව තාරකා රාශි අතුරින් ඉතා උතුරෙන්ම සහ දකුණෙන් ම ඇති තාරකා රාශි නොබසින තාරකා රාශි වශයෙන් සැලැකේ.

සමක තාරකා රාශි සහ පහළ අක්ෂාංශවලට පෙනෙන තාරකා රාශි සාමාන්‍යයෙන් නැගෙනහිරින් පායා බටහිරින් බැසයනු සේ පෙනේ. සමකබදව වෙසෙන අපට තාරකා රාශි පෙනෙනුයේ මේ ආකාරයෙනි.

පොළොවේ හරිමැදින් දකුණේ සිට උතුරට එහි විෂ්කම්භය ඍජු රේඛාවක් සේ ඈත අහසට විහිදුවිහොත් එය පොළොවේ අක්ෂය ලෙස සැලකිය හැකි ය. මෙහි උතුරු කොන පොළොවේ නියම උතුර දක්වයි. උතුරු ධ්‍රැවය වශයෙන් හැඳින්වෙනුයේ එයයි. පොළොවේ මේ උතුරු ඛගෝලයේ උතුර ද වෙයි. උතුරු තාරකාව නොහොත් ධ්‍රැව තාරකාව පෙනෙනුයේ මෙම උතුරු ධ්‍රැවයට අංශක 01 ක් බිටා උර්ෂා මයිනර් තාරකාව දෙසට වන්නට ය. (බිටා තාරකාව උර්ෂා මයිනර් රාශියේ දෙවැන්නට දීප්තිමත් තාරකාවයි.)

ඛගෝලයේ සියලුම තාරකා ඈත අතීතයේ සිට ම තාරකා රාශිවලට බෙදා දක්වා ඇත. ඉන් තාරකා රාශි 48 ක් ග්‍රීක තාරකා විද්‍යාඥයකු වන හිපාචස් විසින් ක්‍රි. පූ. 130 දී පමණ බෙදා වෙන්කොට තුබූ අතර ඒවා ක්‍රි. ව. 140 දී පමණ ඊජිප්තු තාරකා විද්‍යාඥයකු වන ටොලමි විසින් 'Almagest' නම් සිය කෘතියේ ලේඛනගත කොට ඇත. සෙසු තාරකා රාශි 16–18 සියවස්වල දී යුරෝපීය තාරකා විද්‍යාඥයන් විසින් වරින් වර ඊට එකතු කරන ලදින් දැනට තාරකා රාශි 88 කට ඛගෝලය බෙදා වෙන් කොට ඇත.

ධ්‍රැව තාරකාව පෙනෙනුයේ නරඹන්නා සිටින ස්ථානයේ අක්ෂාංශයේ උසිනි. එනම් අක්ෂාංශ 6° 56' පමණ පිහිටි කොළඹ සිට ධ්‍රැව තාරකාව නරඹන්නේ නම්, ඒ පෙනෙනුයේ ක්ෂිතිජයේ සිට 6° 56' ක් උසිනි. සමකබදව පිහිටි ශ්‍රී ලංකාව වැනි රටකට මෙසේ එතරම් උසින් නොපෙනෙන නිසා ඒ දැක ගැනීම මදක් අසීරු ය. මක්නිසාදයත් බොහෝ විට මෙතරම් පහත අහස ඇතැම්විට ගහ කොළ, කඳු ආදියෙන් ආවරණය වී තිබිය හැකි හෙයිනි. එහෙත් එවැනි බාධක රහිත ක්ෂිතිජයක නොවරදවාම එය දැකගත හැකි වනු ඇත. පොළොවේ සමකයේ සිට උතුරට යන්ම එය ක්‍රමයෙන් මුදුන්ව පෙනෙන අතර ධ්‍රැවයේ දී හරියට ම මුදුන් අහසේ දැකගත හැකි ය.

එසේ ම උතුරේ සිට දකුණට යන විට, සමකය පසු කරත් ම ධ්‍රැව තාරකාව ක්ෂිතිජයට වැසී නොපෙනීම යයි.

ධ්‍රැව තාරකාව අයත් වනුයේ ධ්‍රැව තාරකා රාශියක් වන උර්ෂා මයිනර් නොහොත් සුළු වලහා රාශියේ යි. එහි වලහා ගේ වල්ගා කොනේ පෙනෙන දීප්තිමත් ම තාරකාව ධ්‍රැව තාරකාව නොහොත් තාරකා විද්‍යාත්මකව හැඳින්වෙන ඇල්ෆා උර්ෂා මයිනෝරිස් වශයෙන් හැඳින් වේ. බලුවල්ගය යන අරුතින් ඊට ග්‍රීක බසින් සයිනෝසුරා (Cynosura) යනුවෙන් ද නමෙකි.

උතුරු අහස දෙස එක එල්ලේ ම බලා ධ්‍රැව තාරකාව හඳුනා ගැනීම අසීරු ය. එහෙයින් ඒ සඳහා උපයෝගී කොට ගනුයේ පැහැදිලි ව අහසේ හඳුනාගත හැකි උර්ෂා මේජර් නොහොත් මහවලහා රාශියේ තාරකා දෙකක ආධාරයෙනි. මෙම තාරකා දෙක ඇත්තේ නගුල නමින් හැඳින්වෙන වලහා ගේ පසුපස කොටස සලකුණු කෙරෙන කොටසේ ය. එහි ඇති දීප්තිමත් තාරකා දෙක දිග ඍජු රේඛාවක් ඇතැයි සලකා උතුරු දිගට බැලූ විට එම ඍජු රේඛාව යොමු වනුයේ ධ්‍රැව තාරකාව වෙතට ය. ධ්‍රැව තාරකාව ලෙස මෙම සහශ්‍රයේ ඇති අල්ෆා උර්ෂා මයිනෝරිස් නම් මෙම තාරකාව සැම ද ම එසේ නොපවතිනු ඇත. මීට වසර 3000 කට පෙර ධ්‍රැව තාරකාව වශයෙන් පැවතියේ මෙම රාශියේ ම දෙවැන්නට දීප්තිමත් බිටා උර්ෂා මයිනෝරිස් නම් තාරකාවයි. ක්‍රි. ව. 1500 දී ධ්‍රැවතාරකාව 3 1/2° දුරින් පෙනෙමින් තිබී ඇත. එය ක්‍රමයෙන් පොළොවේ නියම උතුරට ළං වෙමින් ඇත. එහි උපරිම ළංවීම වන 0.46° සිදුවනුයේ ක්‍රි. ව. 2192 දී ය. ඉන් පසු ක්‍රමයෙන් ඈත් වන ධ්‍රැව තාරකාව පොළොවේ නියම උතුරින් බොහෝ ඈත්වන අතර එවිට පොළොවේ උතුර යොමුවනුයේ කාසියෝපියා රාශියට බටහිරින් පෙනෙන සෙපියස් රාශියේ අල්රායි (එඩේරා) නම් වූ එහි තෙවැන්නට දීප්තිමත් තාරකාව වෙතටයි. ඒ ක්‍රි. ව. 7000 දී ය. ඊට කලින් එළැඹෙන කාලය තුළ පොළොවේ නියම උතුර දක්වන දීප්තිමත් තාරකාවන් ඇති විය හැකි ය.

ඈත අතීතයේ දී පොළොවේ ධ්‍රැව තාරකාව වී ඇත්තේ විවිධ තාරකා ය. රෝමයේ ජූලියස් සීසර් බෲටස් විසින් ඝාතනය කළ කාලයේ පොළොවේ ධ්‍රැව තාරකාව බිටා උර්ෂා මයිනෝරිස් විය.

මීට වසර 4000 කට පමණ පෙර ඊජිප්තුවේ මිසර ජාතිකයන් යෝධ පිරමීඩ ඉදිකළ කාලයේ ධ්‍රැව තාරකාව වූයේ ඩ්‍රැකෝ (මකරා) රාශියේ තුබාන් නම් තාරකාවයි.

වසර 15,000 කට පෙර ලයිරි (වීනාව) රාශියේ වෙගා නම් තාරකාව ධ්‍රැව තාරකාව ලෙස පැවතුණු බව පෙනේ.

ධ්‍රැව තාරකාව මෙසේ කලින් කල වෙනස් වීමට හේතුව නම් විෂුව පූර්වායනය (Precession of the equinoxes) නම් වන ස්වාභාවයයි. මෙය පැරණි තාරකා විද්‍යාඥයන් විසින් කරන ලද එක් වැදගත් සොයාගැනීමකි.

ක්‍රිස්තෝදයට පෙර තුන්වැනි සියවසේ දී සමෝස් හි වාසය කළ ඇරිස්ටාකෝස් නම් විද්‍යාඥයා විසින් පොළොවේ විෂුව පූර්වාස්නය නොහොත් පොළොවේ වැනීම (wobble) සොයා ගන්නා ලදී.

බඹරයක් බිම කරකැවෙන විට ඒ කෙරේ දක්වන පොළොවේ ගුරුත්වාකර්ෂණය නිසා එහි භ්‍රමන




වසර 25,800 ක් තුළ පොලෝ අක්ෂයේ චලිතය

ධ්‍රැව තාරකාව මෙසේ කලින් කල වෙනස් වීමට හේතුව නම් විෂුව පූර්වායනය (Precession of the equinoxes) නම් වන ස්වාභාවයයි. මෙය පැරණි තාරකා විද්‍යාඥයන් විසින් කරන ලද එක් වැදගත් සොයාගැනීමකි. ක්‍රිස්තෝදයට පෙර තුන්වැනි සියවසේ දී සමෝස් හි වාසය කළ ඇරිස්ටාකෝස් නම් විද්‍යාඥයා විසින් පොළොවේ විෂුව පූර්වාස්නය නොහොත් පොළොවේ වැනීම (wobble) සොයා ගන්නා ලදී.

වේගය හීන වෙමින් එහි අක්ෂය විසින් කේතුවක පතුලේ මෙන් වෘත්තයක් අහසේ සටහන් කරනු මෙන් පෙනේ. පොළොව ද බඹරය මෙන් සිය අක්ෂය වටා භ්‍රමණයවීමේදී හඳේ සහ සූර්යයා ගේ ඒකාබද්ධ ගුරුත්වාකර්ෂණය එහි සමක ප්‍රදේශ කෙරේ බලපාන හෙයින් පොළොවේ වැනීමක් ඇතිකරයි. එය ද බඹරය සේ ම අහසේ යෝධ වෘත්තයක් සටහන් කරයි. මේ වෘත්තය සම්පූර්ණ වනුයේ වසර 25, 800 ක දී ය. අංශක 47 ක විෂ්කම්භයක් ඇති මෙම වෘත්තය සටහන් වනුයේ වසර 175 කට 01° බැගිනි. පොළොවේ අක්ෂය මේ වසර 25,800 තුළ එසේ සටහන් වන වෘත්තය දිගට යොමුවන ඕනෑම තාරකාවක් ධ්‍රැව තාරකාව වශයෙන් පොළොවට පෙනේ. පොළොවේ මේ වැනීමේ ස්වාභාවය නිසා, පොළෝ කක්ෂ තලයට ඇති 23ම 27' ක ඇලය නොවෙනස්ව පවතී. පොළොවේ මෙම ඇලය නොවන්නේ නම් පොළොවේ වැනීම මීට වඩා බෙහෙවින් අඩුවිය හැකි අතර ස්ථිර ධ්‍රැවතාරවක් ද දැකිය හැකි වනු ඇත.

උතුරු ධ්‍රැව තාරකා රාශි අතර ධ්‍රැව තාරකාව වශයෙන් කලින් කල ඇතැම් තාරකා යොදගත හැකි වුවද දකුණු ධ්‍රැව තාරකා රාශි අතර පොළොවේ නියම දකුණ සොයාගැනීම උපයෝගී කර ගත හැකි සුවිශේෂ තාරකාවක් තිබී නැත. එහෙත් වසර 3000 කට පමණ පෙර ක්ෂීරපථයේ උප චක්‍රවාටයක් සේ සැලැකෙන මැගලන් පටල දෙකින් කුඩා පටලය පොළොවේ දකුණු අක්ෂය කෙළින් පෙනෙන්නට තිබී ඇතැයි විද්‍යාඥයෝ විශ්වාස කරති.

ධ්‍රැව තාරකාව පෙනෙන රාශියේ පියවි ඇසට පෙනෙන තවත් තාරකා හයක් දැකගත හැකි ය. යා කළ විට සෘජුකෝණාස්‍රයක් ඇඳිය හැකි කොටුවක් ද ඉන් උතුරට විහිදුණු වල්ගයක් වැනි වක්‍රයක් ද මෙම රාශියේ කොටසක පෙනේ. මෙහි කොටුවේ තාරකා සතරෙකි. වක්‍රයේ අනෙක් තාරකා තුන ය. ඉන් අග ම ඇති දීප්තිමත් තරුව ධ්‍රැව තාරකාවයි. මේ තාරකා හත එකම පසුතලයක ඇති මැතික් කැට මෙන් පෙනුනද ඒවා ඇත්තේ එකිනෙකට බොහෝ දුරිනි.

ධ්‍රැව තාරකාව ආලෝක වර්ෂ 470 ක් දුරින් පිහිටා ඇති අතර දෙවැන්නට දීප්තිමත් කොටුවේ පිහිටි කොචාබ් නම් තාරකාව ආලෝක වර්ෂ 105 ක් දුරින් පිහිටියකි. ඊට වඩා දීප්තියෙන් අඩු, ඊට දකුණතින් ඇති, තෙවැන්නට දීප්තිමත් පිකාඩ් නම් තාරකාව ආලෝක වර්ෂ 180 ක් දුරින් පිහිටා ඇති බව විද්‍යාඥයන් විසින් සොයා ගෙන ඇත. නො පැහැදිලි අනෙක් තාරකා සතර ද ආලෝක වර්ෂ 200 කට වඩා දුරින් පිහිටි ඒවා ය.

ධ්‍රැව තාරකාව දෙනෙතියෙන් පෙනෙනුයේ කහපාටට සමීප වර්ණයකිනි. අපේ සූර්යයාට වඩා උෂ්ණත්වයෙන් අධික ධ්‍රැව තාරකාවේ මතුපිට උෂ්ණත්වය 7000ම ක් පමණ වෙතැයි විද්‍යාඥයෝ කල්පනා කරති. ධ්‍රැව තාරකාව අයත් වනුයේ සුපිරි යෝධයන් නම් වන දැවැන්ත තාරකා ගණයට ය. එහි විස්කම්භය අපේ සූර්යයාගේ මෙන් 120 ගුණයකි. (සූර්යයාගේ විෂ්කම්භය කි. මී. 13, 83,040 කි) අපේ සූර්යයා සිකුරු ග්‍රහයා තරම් විශාල යයි උපකල්පනය කළහොත් ධ්‍රැව තාරකාව අපේ සූර්යයාටත් වඩා මඳක් විශාල ය.

සෙසියිඩ් නම් වන සුවිශේෂ තාරකා වර්ගයකට අයත් ධ්‍රැව

ධ්‍රැව තාරකාව දෙනෙතියෙන් පෙනෙනුයේ කහපාටට සමීප වර්ණයකිනි. අපේ සූර්යයාට වඩා උෂ්ණත්වයෙන් අධික ධ්‍රැව තාරකාවේ මතුපිට උෂ්ණත්වය 7000ම ක් පමණ වෙතැයි විද්‍යාඥයෝ කල්පනා කරති. ධ්‍රැව තාරකාව අයත් වනුයේ සුපිරි යෝධයන් නම් වන දැවැන්ත තාරකා ගණයට ය. එහි විෂ්කම්භය අපේ සූර්යයාගේ මෙන් 120 ගුණයකි.




අහසේ තාරකා රාශිවලට ග්‍රීක සහ රෝම දේව කතා ආරෝපණය කැර ඇත. එම කතාවල එන වීරයන්, සතුන් සහ භාණ්ඩ නමින් තාරකා රාශි හැඳින්වීම ද පටන් ගැනුණේ ඒ කාලයේ දී සිට ය.

තාරකාව දින සතරක කාලයක් තුළදී දීප්තිය අඩුවැඩිවීමේ චක්‍රයක් අනුව බැබළෙයි. මෙම සුවිශේෂ තාරකා වර්ගය මුලින් ම සොයාගැනුණේ සෙපියිඩ් රාශියේ බැවින් විෂයෙහි මේ තාරකා වර්ගයට ඒ නම් යොද ඇත.

ධ්‍රැව තාරකාව අසල පෙනෙන්නට (දුරදක්නයෙන්) ඇති තවත් උප තාරකාවක් 1779 දී විලියම් හේවල් නම් තාරකා විද්‍යාඥයා විසින් සොයා ගැනිණ. මෙම තාරකාව ද අපේ සූර්යයාට වඩා විශාල වුවත් ධ්‍රැව තාරකාවට වඩා බෙහෙවින් කුඩා ය.

මේ තාරකා දෙක පොදු ගුරුත්වාකර්ෂණ කේන්ද්‍රයක් වටා පරිභ්‍රමණය වන යුගය තාරකා පද්ධතියක් දැයි තවම විද්‍යාඥයෝ නොදනිති.

මක්තිසාදයන් උප තාරකාවේ කක්ෂය ගණනය කිරීමට තවම විද්‍යාඥයන්ට නොහැකි වී ඇති හෙයිනි.

අහසේ තාරකා රාශිවලට ග්‍රීක සහ රෝම දේව කතා ආරෝපණය කැර ඇත. එම කතාවල එන වීරයන්, සතුන් සහ භාණ්ඩ නමින් තාරකා රාශි හැඳින්වීම ද පටන් ගැනුණේ ඒ කාලයේ දී සිට ය.

සුළුවලහා සහ මහ වලහා රාශි දෙක සම්බන්ධ කොට ප්‍රචලිත කතාන්දරයක් ද වෙයි.

එම කතාන්තරය අනුව මහ වලහා හුදෙක් ආකාඩියාවල රජු වූ ලයිකෝන් ගේ කැලිස්ටෝ නම් දියණියයි.

වරෙක ඇයට වලසකු සේ වෙස්වලා ගැනීමට සිදු විය. මක්තිසාදයන් සියෙස් ගේ බිරිය වූ හේරා ගේ කෝපය සහ ඊර්ෂ්‍යාවෙන් බේරීම සඳහා ය. මෙසේ වලසෙකු ගේ වෙස්ගෙන වනයේ සැරිසරණ විට ඒ බව නොදත් ඇය ගේ පුත් අකාස් වලහා විද මරන්නට තැත් කළේ ය. මෙය දුටු දෙවිවරු සිදුවන්නට ගිය විනාශය වලකා ලනු වස් අකාස් කුඩා වලසා සේ ද, මව මහවලසා සේද අහසේ රුඳවූහ. අද සුළු වලහා සහ මහ වලහා ලෙසට තාරකා රාශි අතර පෙනෙනුයේ ඒ මව් – පුත් දෙදෙනා ය.

හේරා ගේ සතුරුකම නිසා මේ තාරකා රාශි දෙකට කිසිදිනෙක ක්ෂිතිජයෙන් පහළට බැස යන්නට ඉඩ නොදෙයි. එහෙයින් ඒවා ධ්‍රැවය වටා භ්‍රමනය වෙමින් පවතින බව එම කතාන්තරයෙන් කියැවෙයි. ❑